# පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

# අපේ ළමා ප්‍රසංග

පහුගිය මාසේ අපේ තුන් දෙනාගේ සති අන්ත ගෙවුණොම අපේ පුංචි ඈයින්ගේ වැඩ කටයුතුත් එක්ක.

"පුංචි එවුන්ගේ දේවල් දිහා බලං ඉන්නකොට දවස ගතවෙනවා තේරෙන්නෙ නෑ...." පැන්සල කිව්වා. "අලි පැටියෙක් දිහායි පොඩි ළමයෙක් දිහායි මොනතරම් බලං හිටියත් ඇති වෙන්නෙ නෑ කියලනෙ කියන්නෙ..." පන්හිඳ අපේ පැරැන්නන්නෙ කතාවක් කිව්වා.
" නිකං ඉන්නම බෑනෙ. විසේ " විසේ !" පින්සලත් හවුල් වුණා.

ඔක්තෝම්බර් මාසේ ළමා දිනය සමරන්නත් එක්ක මිහිඳු ළමා පදනමෙන් ඉදිරිපත් කරපු "පුංචි අපියි " පරිසරයයි" විවිධ ප්‍රසංගයට අත හිත දුන්නෙ විනීතා විජේරත්න නෝනා මහත්තයා. පසුතල චිත්‍ර එහෙම ළමයින්ට ගැලපෙන්න ඇඳලා හඳලා තිරේ පිටිපස්සේ ඉඳන් කර දුන්නෙ සරත් විජේරත්න මහත්තයා. "කැන්ගරු ගීතය" පොත එළිදැක්වීමත් ප්‍රසංගයේ අංගයක් වුණා. ආචාර්ය ප්‍රේමා කුඩලිගම නෝනා මහත්තයා ඒ ගැන කතා කළා. සරස්වතී පූජා නැටුමක්, සූරියකාන්ත මල ගැන නැටුමක්, පරිසරය ගැන නැටුමක්, තවත් ළමා සින්දු කීපයකට නැටුම් වගේම අන්දරේගේ කතාවකින් හදපු ළමා නාට්‍යයත් ප්‍රසංගයට ඇතුලත් වුණා. කර්නල් පී. එස්. කුඩලිගම මහත්තයාගේ කතාව වගේම නිසුර පෙරේරා පුතාගේ කතාවත් පියුමිකා ද සිල්වා දියණියගේ පිළිගැනීමේ කතාවත් කාගේත් හිත් ගත්තා.

නොවැම්බර් මාසයේ සිංහල භාෂා, ඉස්කෝල හතරක විවිධ ප්‍රසංග වලට සහභාගී වෙන්න අපේ අයට ඉඩකඩ ලැබුණා. මේ හැම උත්සවයකටම ගිහින් තුන්දෙනා ගෙදර ආවෙ හරිම සතුටින්. ඒ ගැන ලිව්වොත් හොඳයි කියලා පන්හිඳට හිතුණා.

මෙවර සිංහල භාෂා පාසැල් හතරක්ම වාර්ෂික ප්‍රසංග පැවැත්වීමට යෙදුණේ ඉල් මාසයේදීයි. මුලින්ම තිබුණේ බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසලේ සිසු සිසුවියන් ඉදිරිපත් කළ වාර්ෂික විවිධ ප්‍රසංගයයි.

ශාලාවට ඇතුල්වන විට ම පිළිගැන්වුණු සමරු කලාපයේ කවරය සැරසී ගත්තේ කුඩා දරුවකු නුවර පෙරහැර සිත්තම් කළ චිත්‍රයකිනි. උත්සවයේ ස්වභාවය හා පරමාර්ථය එම සමරු කවරයෙන්ම මොනවට පිළිඹිබු විණ. කුඩා දරුවන් වැයු සක් හා භේරී වාදනයන්ගෙන් ද උඩරට නර්ථනයන්ගෙන් ද යුත් පෙරහැරකින් ආරාධිතයන් ශාලාව තුලට කැඳවාගෙන යාමෙන් හා බුලත් හුරුළු දී "ආයුබෙ-ර්වන්" කියා පිළිගැනීමෙන් උත්සවය ඇරඹිණ. ආරාධිතයින් හා දරුවන් කීප පොළක් පොල්තෙල් පහණ දැල්වීම ද එම ඇරඹුමට එක් විය. උඩරට ඔසරියෙන් සැරසීගත් දැරියන් කීපදෙනෙකු අතින් බුලත් අත් පිරිනමනු ලැබුයේ. සභාපති සරත් විජේසූරිය මහත්මාගේ පිළිගැනීමේ කථාවත්, බෙරික් ශාක්‍යමුනි විහාරස්ථයානාධිපති ගරු දිගාමඩුල්ලේ විමලානන්ද හිමියන්ගේ අනුශාසනාවත්, යුරෝක් ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී ලිස් බීටී මහත්මියගේ කථාවත් අවසන විද්‍යාලයීය වෙබ් අඩවිය දෙරට වැඩීමේ අංගය පැවැත්විණ. අනතුරුව විදුහල්පති ජයන්ත වන්න-ආරච්චි මහත්මාගේ ස්තූති කථාව පැවැත්වීමට යෙදිණ.

කුඩා දරුවන්ගේ ඉදිරිපත් කිරීම් පූජා නැටුමකින් ඇරඹිණ. එම සරස්වතී අභිනන්දනය ඉදිරිපත් කරන ලද්දේ පළමු වසර කුඩා දරුවන් විසිනි. බාලාංශයේ පොඩිත්තන් ඉදිරිපත් කළ "ගුරුතුමා මමයි" අංගය සිත් ගන්නා සුළු විය. අනතුරුව " අපි ටියුෂන් යමු" අංගය තුන වසරේ දරුවන් විසින් ද, "මල් වගේ නංගී" ගීතයට නැටුමක් හතර වසරේ දරුවන් විසින්ද, විරිඳු ගායනයක් දෙවන වසරේ දරුවන් විසින් ද, තවත් ගීතයකට නැටුමක් පළමු වසර දරුවන් විසින්ද, බුලත් දීම අලෙලා කළ නැටුමක් නවය වසර දරුවන් විසින්ද ඉදිරිපත් කරන ලදී.

පහ වසරේ දරුවන් ඉදිරිපත් කළ "මලී ගේ කතාව" කෙටි නාට්‍ය කුඩම්මා කෙනෙකුගේ අතවර ඉවසාගත නොහී වනගත වු දරුවන් කීපදෙනෙකු සම්බන්ධව ලියැවුණ පිටපතක් විය. හත වසරේ දරුවන් "ඕලු නෙලුම්" ගීතයට නැටුමක් ඉදිරිපත් කරන ලදී.

හත වසර දරුවන් ඉදිරිපත් කළ "අකෘතඥයා" නාට්‍යය කෙටි නාට්‍යයක් ලෙස සැළකිය නොහැකියි. සිය මවගේ මළගම ඇසුරින් අතීතයට පිවිසෙන පුතෙකුගේ ආවර්ජනාවන් නාට්‍යමය අකාරයෙන් ඉදිරිපත් කළ අන්දම අගේ කළ යුතුයි. වේදිකා සැරසිලි, අවශ්‍ය අංගෝපාංග යනාදිය පිළියෙල කරදීමෙන් දෙමව්පියන් දැක් වු සහයෝගය වඩාත් ඉස්මතු වු අංගයකි මේ. දරුවන් බහුතරයකගේ රඟපෑම් ද බලාපොරොත්තු විය හැකි මට්ටමට ඉහළින් පැවතිණ.

බාලාංශයේ දරුවන් ඉදිරිපත් කළ "ගොවි ගීතයද" සුරතල් ඉදිරිපත් කිරීමක් විය. හය, අට සහ නවය වසරවල දරු-වන්ගේ "ජීවන ගමන" නාට්‍යය ද පෙර සේම අගැයිය යුතු තලයක විය. අනතුරුව පහ වසර සිසුන් ඉදිරිපත් කළ අභිරූපන අංගය මෙවන් ප්‍රසංගවල විරළව දක්නට ලැබෙන අංගයක් විය. පිරිස එක් කරගෙන සංගිත කණ්ඩායමක් පුහුණු කරවා ගන්නා අන්දමත්, අවසන කණ්ඩායමක් ලෙසින් වාදනය කිරීමත් අභිරූපනයෙන් දැක්වීම එම කලාවේ ප්‍රවීණයන්ටවත් සිහිපත් නොවුණ මාතෘකාවක් විය. ඊට සහභාගී වු දරුවන් හට රිද්මය අවශ්‍ය වු අංගයකි ඒ.

"ඉර මාමා යන්න ගිහින්" දෙවන වසරේ තවත් සුරතල් ඉදිරිපත් කිරීමකි. "වරද කාගෙද ?", හත වසරේ "ධාතුසේන රජතුමා" නාට්‍ය දෙකට අමතරව තුන වසරේ නැටුමත් එක වසරේ නැටුමත් ප්‍රසංගයට එක් විය. නවය වසර ඉදිරිපත් කළ " පනාව හැංගීම" ජන කවි ගායනය හා රංගනයත් හතර, පහ සහ හත වසර එක්ව ඉදිරිපත් කළ සළු පාලියත් ප්‍රසංගයට විවිධත්වය එක් කරමින් දරු-වන්ගේ දක්ෂතා වේදිකා ගත කිරීමට දයක විය.



සියලු අංග සම්බන්ධීකරණය කරමින් පෙළ ගැන්වු මෙල්බර්න් රංගනවේදී නන්දසිරි ද සිල්වා කෘතවේදීව සිහිපත් කළ යුතුවේ. පාසැලේ ආචාර්ය මණ්ඩලය වු ශාන්තා ගමගේ, චන්දි මාපා, සොනාලි නානායක්කාර, දර්ශනී පෙරේරා, රම්‍ය තිලකරත්න, ශ්‍රියානි බමුණුසිංහ, ජයන්ත ශ්‍රීපාලි හෙට්ටිආරච්චි, ප්‍රසන්න ද අල්විස්, පුෂ්පිකා ගමගේ, කෙනත් හඬිකෝරාල යන මහත්ම මහත්මීන් උත්සවය අවසන උපහාරයට ලක්විණ.

රොස්බර්ග් පාර්ක් සහ මිල් පාර්ක් මධ්‍යස්ථානයන්හි විසි වසරක සැමරුම "ආවර්ජනා 2011" තිළිණ ප්‍රදනෝත්සවයක් විය. ශ්‍රී ලංකා මහ කොමසාරිස් අද්මිරාල් තිසර සමරසිංහ මහත්මාගේ ද සහභාගීත් වයෙන් නැවැත්වීමට යෙදුන මෙම උත්සවය ආරාධිතයින් පිළිගැනීමෙන් ඉක්බිතිව පොල් තෙල් පහණ දැල්වීමෙන් ඇරඹිණ. සුභාෂි එදිරිවීර සිංහල භාෂාවෙන් ද සියෝ ද ජයවර්ධන ඉංග්‍රීසි භාෂාවෙන් ද පිළිගැනීමේ කථා පැවැත්වීමෙන් අනතුරුව වික්ටෝ රියානු භාෂා පාසැලේ විදුහල්පති ෆ්‍රැන්ක් මලීනෝ මහතා, ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයා සහ මිල් පාර්ක් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ලිලී ඩි ඇම්බ්‍රෝසියෝ මහත්මිය ආරාධිත දෙසුම් පවත්වන ලදී. අනතුරුව හිමාලි කරුණාසේන මහත්මිය උත්සවයේ පරමාර්ථය පිළිබඳව හැඳින්වීමක් කරන ලදී. අනතුරුව පළවන හා දෙවන ශ්‍රේණිවලින් ඉදිරිපත් කළ රංගනය අක්කේ ටිකක් ඉන්නකෝ" ගීතයට අනුව කළ නිර්මාණයකි.

අනතුරුව පැවැත්වුනේ ප්‍රජා සේවයක් වශයෙන් පාසැල්වලට උපකාර කළ දයකයින් වෙනුවෙන් තිළිණ ප්‍රධානයයි. වසරේ විශිෂ්ඨ කුසලතා සඳහා සිරිමා වාදසිංහ තිළිණය පිරිනැමුණේ හිමාලි කරුණාසේන ගුරුමහත්මියටයි. දහවන වසර හා වී.සී.ඊ. සිසුවියන් ගේ නර්ථනාංගයක් ඉන් අනතුරුව ඉදිරිපත් විණ. තුරගා හා නයි අඩි වන්නම ඇසුරු කරගත් නර්ථනය වෙනුවෙන් සජීවීව ගායනා ඉදිරිපත් කළේ සුපුන් ලොකුලියන දියණියයි. බටහිර වාද්‍ය තාල යෙදුණද බෙර හඬකින් හෝ වෙනත් තාල වාද්‍ය භාණ්ඩයකින් තොරවයි නර්ථනය ඉදිරිපත් වුයේ. කර්නල් වී. එඩ්. කුඩලිගම මහත්මාගේ ආරාධිත දෙසුමෙ-න් අනතුරුව විදුහල්වල අතීත මතක සටහන් පරිගණකයක් ඇසුරින් තිරගත විය. අනතුරුව එළැඹියේ සිසුන් සඳහා තිළිණ සහ සහතික පත් ප්‍රධානයයි. මධ්‍යස්ථාන දෙකේහිම අචාර්ය මණ්ඩලය වු හිමාලි කරුණාසේන, විපුලි ගුණසේකර, ගංගා කාන්ති වික්‍රමසූරිය, හේමසිරි, නිරංජනා කුඩලිගම, ප්‍රේමා කුඩලිගම මුණසිංහ, මහේෂා ලොකුලියන, ලෙස්ලි තිසේරා, ලිලංගා බාලචන්ද්‍ර, ශ්‍රියානි ජයවික්‍රම, මාලනී වෙත්තසිංහ, වත්සලා ඉෂ්ටවීර, තරංගා ගුණසේකර යන මහත්ම මහත්මීන් හටද උපහාර පිරිනැමිණ.

විවේකයෙන් අනතුරුව සෙත්මි දියුණුගල දියණියගේ ඕගන් වාදනයක් ද දිනුකි රාජපක්ෂ දියණියගේ ගායනයක් ද පැවැත්වුණ අතර ඉහළ ශ්‍රේණිවල සිසු-න් සඳහා තිළිණ ප්‍රධානය ඉනික්බිතිව ඇරඹිණ. " මලක් පිපෙන හැටි" ගීතයට මව්බිමේ පාසැල්

***ළමයින් සඳහාම වෙන් වුන් වේදිකාවක් අප දුටුවේ කවතා පාසැල් ප්‍රසංගයේ දී බව අවංකවම සඳහන් කළ යුතුයි. පොල්තෙල් පහණ දැල්වීම, ක්ෂේත්‍ර නිලධාරීනියගේ කථාව සහ ගුරු උපහාර දැක්වීම හැරුණු විට වේදිකාවේ කිසි තැනෙක වැඩිහිටියන් දක්නට නොලැබිණ.***

ඇඳුමින් සැරසුණ දෙක හා තුන ශ්‍රේණිවල දරුවන් විසින් ඉදිරිපත් කරන ලදී. සඳනි හාල්පාන්දෙනිය දැරිය විසින් ස්තූති කථාව කිරීමෙන් අනතුරුව ශ්‍රිනාත් මද්දුමගේ රංගනවේදියා චින්තක සිරිකුමාර රංගනවේදියා සමගින් ඉදිරිපත් කළ ආරාධිත රංගනයෙන් උත්සවය නිමා විය. සියළු දෙමව්පියන් මෙන්ම විජය කරුණාසේන මහත්මා දැක්වු සහය විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

අවසන් වශයෙන් අප සහභාගී වුයේ නෝබල් පාර්ක් හි කාවතා මධ්‍යස්ථානයේ සිංහල භාෂා පාසැලේ වාර්ෂික විවිධ ප්‍රසංගයටයි. ආරාධිතයින්, ගුරු මණ්ඩලයේ කීපදෙනෙකු සහ සිසු සිසුවියන් කීප දෙනෙකු සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහණ දැල්වීමෙන් අනතුරුව දිනාශා විමලසිරි දැරිය සිංහලෙන් සහ නිසුර පෙරේරා දරුවා ඉංග්‍රීසියෙ-න් පිළිගැනීමේ කතා කළහ. ආරාධිත කෙෂ්ස්ත්‍ර නිලධාරිනී, කොනී බ්‍රැන්බෙල් මහත්මිය සාරියෙන් සැරසීගෙන කුඩා දරුවන් අමතා කළ කථාව සිත් ඇඳගන්නා සුළු වීය. ඉදිරිපස ආසනවල වාඩි වී හුන් කුඩා දරුවන් අමතා වේදිකාවේ දණ ගසාගෙන කළ ඇයගේ කථාව අතිශයින් හෘදයාංගම විය. තිරය පසුපස උදව්දෙන දෙමව්පියන්, ඔවුන් සකස් කළ ඇඳුම් පැළැදුම් යනාදිය පවා අගය කරමින් කථා කළ ඇය ප්‍රසංගය පුරා ඡායාරූප ගනිමින් රස වින්දය.

සරස්වතී පූජා නැටුමකින් දරුවන්ගේ අංග ඇරඹිණ. "ගඟයි " මුහුදයි" විරිඳු ගායනා කළ දියණියන් දෙදෙනාට සජීවීව රබාන වයමින් සහය වුයේ එම පංතියේම පුතෙකි. ඒ වසර 9"10 පන්තිවල ඉදිරිපත් කිරීමකි. බටහිර ළමා ගී තනුවකට සිංහල වචන යෙදු ගීයකින් වසර එක " දෙක දරුවෝ අනතුරුව සභාව පිනවුහ. වසර තුන"හතර දරුවන් "දන්නෝ බුදුන්ගේ" ගීයට මනා සංයමයකින් යුක්ත වු අංගයක් විය. වසර හතරේ සිට හත දක්වා පන්තිවල සිසුන් එක්ව ඉදිරිපත් කළ " කැකිල්ලේ රජ්ජුරුවෝ" සහ වසර නවය " දහය පන්තිවල සිසුන් ඉදිරිපත් කළ "ගමරාල දිව්‍ය ලෝකෙ ගිය හැටි" කෙටි නාට්‍ය දෙකට අමතරව දරුවන්ගේ රංගන කුසලතා එළි දැක් වු අනෙක් අංග වුයේ වසර දහය, එකොළහා සහ දොළහා පන්තිවල සිසුන් ඉදිරිපත් කළ නිදහස් ආරයේ විවිධාංගයි. වසර දහයේ සිසුවියන් ඉදිරිපත් කළ නර්ථනය මෙන්ම වී.සී.ඊ පන්තියේ සිසුවියන් ඉදිරිපත් කළ නර්ථනය ද ප්‍රශස්ථ මට්ටමේ විය. "ඉරෙන් හඳෙන්" ගීය සඳහා වසර එක " දෙක පන්තිවල කුඩා දරුවන් ඉදිරිපත් කළ නැටුම් සහ "මොනවද අම්මේ" ගීතය සඳහා වසර හතරේ සිට හත දක්වා පන්තිවල සිසුන් ඉදිරිපත් කළ රංගනය ද සිත්ගන්නා සුළු විය. මෙහිදී පසු තිරයේ ළමා චිත්‍ර විශාලව තිරගත කිරීම අතිශයින්ම අගය කළ යුතු වු අදහසක් විය.

අනතුරුව වසර තුන " හතර පන්තිවලින් ද විරිඳු ගායනයක් ඉදිරිපත් විණ. "ලක් මෑණිට විරිදු" නම් වු එම අංගයට දරුවන් පස් හය දෙනෙකුම කට පාඩමින්, නිවැරදිව වචන උසුරුවමින් නියම තාලයට ගැයීම තවත් අගය කළ යුත්තක් වීය. "හොඳ හොඳ ළමයින්" ගීතයට වසර හතරේ සිට හත දක්වා සිසුන් විසින් ඉදිරිපත් කළ නර්ථනයට අමතරව වසර එක සහ දෙක පන්තිවල කුඩා දැරියන් ඉදිරිපත් කළ පෙර " අපර දිග නැටුම් සංකලනය ප්‍රේක්ෂකාගාරයේ ඔල්වරසන් මධ්‍යයේ නොමඳ අගැයුමට ලක්විණ.

නිදහස් අංගයේ විවිධාංග අතරට එක් වු වසර 10"11 පන්තිවල සිසුන් ඉදිරිපත් කළ "විජය " කුවේණි" අංගයද වඩාත් රංගන ප්‍රතිභාව දැක් වු අංගයක් විය. අවසන් අංගය වු පාසැලේ ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ විවිධාංගය ඉතාම නිදහසේ එකිනෙකාගේ කුසලතා ඉස්මතු කර දැක්වීම නිසි සේ සැළසුම් සහගතව නිර්මාණය කරන ලද්දක් වීය.

අවසානයේ රවීන් ඒකනායක දරුවා සිංහලෙන් සහ පියුමිකා ද සිල්වා දැරිය ඉංග්‍රීසියෙන් ද කෙටි ස්තූති කථා පවත්වන ලද්දේ තමන්ට සිංහල දැණුම වඩවන රෝහිණී ජයකොඩි, තුෂාර ප්‍රනාන්දු, චන්ද්‍රා ගමගේ, සුජාතා කනහැර, ඉන්දිකා ප්‍රනාන්දු සහ පුණ්‍යා පාදුක්කගේ යන ගුරු මහත්ම මහත්මීන්ට මල් කළඹ පිරිනමමින් හා දණින් වැඳ වැටෙමින් ගෞරව කිරීමෙනි. ප්‍රසංගය සඳහා ඇප කැප වු සියළු දෙමව්පියන් මෙන්ම සියළු දේ සම්බන්ධීකරණය කරමින් කටයුතු කළ දෙස්තර චන්ද්‍රා අතගල මහත්මා ද මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුව ඇත්තේය.

දීර්ඝ වශයෙන් අංග පිළිබඳව ලියැවුණ ද අපව වඩාත් ඇඳ බැඳ ගත් දේ පිළිබඳව කෙටියෙන් හෝ සටහන් කිරීම වැදගත් යැයි හැඟීමු. ප්‍රසංග අතරින් බ්‍රන්ස්වික් පාසැලේ ප්‍රසංගය වඩාත් උත්සව ශ්‍රීයෙන් විරාජමාන වීය. ඇඳුම්, පැළඳුම් වේදිකා සැරසිලි පිළිබඳව දෙමව්පියන් දක්වා ඇති උනන්දුව පුදුම සහගතයි.

සමරු කලාප මුද්‍රණය කරමින් මෙන්ම ඒ " ඒ අංග සඳහා ඒ " ඒ පන්ති වල සිසුන්ට ම ඉඩ සලසා දීම සඳහා වෙනම පීඨිකාවක් ද දර්ශන ගත කිරීම් සඳහා ශාලාව මැද වෙනම පීඨිකාවක් ද ඉදිකරමින් ඒ සඳහා වු කැපවීම, වෙහෙස

25 වන පිටට